# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් ලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


මගේ අංකය / எனது இல / My No } චක්‍රලේඛ 2021

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2021.06.23

25 JUN 2021

චක්‍රලේඛ අංක 2021/03

සියලුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

<u>තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීමේ වැඩසටහන යටතේ තෝරාගත් පුද්ගලයින් වෙත රජයේ ඉඩම් ලබා දීම</u>

තරුණ ව්‍යවසායකයන්ට ඉඩම් කැබලි 100,000 ක් සඳහා අයෝජන අවස්ථා ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ, ඉඩම් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද උපදෙස් හා මගපෙන්වීම් යටතේ සුදුසුකම් ලබන තරුණ ව්‍යවසායකයින් හා ඔවුන් වෙත ලබාදිය හැකි ඉඩම් කැබලි මේ වනවිටත් ඔබ විසින් හඳුනාගෙන හෝ හඳුනාගනිමින් සිටී. ඒ අනුව එසේ හඳුනාගත් ආයෝජකයින් සඳහා සිය ව්‍යාපාර කටයුතු කඩිනමින් ආරම්භ කිරීම සඳහා ඉඩම් භාර දීම කඩිනමින් කළ යුතුව ඇත. ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමේ අරමුණින් ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

මෙම වැඩසටහන යටතේ තරුණ ව්‍යවසායකයින් විසින් යෝජිත ව්‍යාපෘතිය වෙනුවෙන් සුදුසු වන බිම් කොටසක්ම ලබා දීමට හැකි උපරිම උත්සහාය දැරිය යුතු අතර, ඒ අනුව තරුණ ව්‍යවසායකයන් සඳහා ලබා දීමට හඳුනාගත් ඉඩම් හා අදාළ ව්‍යවසායකයන් පිළිබඳ ලැයිස්තුවක් 2021.07.10 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කරන්න. තවද ජනාධිපති ලේකම් කාර්යාලයේ දින නියම කොට වැඩ සටහන දියත් කිරීමට උපදෙස් ලද වහාම මෙම ඉඩම් කොටස් භාරදීමට සූදානම්ව සිටින ලෙස මෙයින් අවධාරණය කෙරේ.

**01. තෝරාගත් එක් එක් ව්‍යවසායකයා වෙත ලබාදිය හැකි රජයේ ඉඩම් කොටසක් හඳුනාගෙන ඇති අවස්ථාවලදී.**

**1.1. ඉඩම් කොටස් මැනුම් කිරීම.**

හඳුනාගන්නා ලද රජයේ ඉඩම් කොටස් මැන සලකුණු කිරීම අත්‍යාවශ්‍ය බැවින් ග්‍රාම නිලධාරි වසම් යටතේ හඳුනාගන්නා ලද ඉඩම් එකවර මැනුම් කිරීමට හැකිවන පරිදි මැනුම් ඉල්ලීමක් දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත යොමු කළ යුතුවේ. එම මැනුම් ඉල්ලීම සම්බන්ධයෙන් වූ ලේඛනයක් පසු විපරම් කිරීමට හැකි වන පරිදි මා වෙත යොමු කළ යුතුය. හඳුනාගත් සියලුම ඉඩම් කැබලි සඳහා වන මැනුම් ඉල්ලීම් එකවර යොමු කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව 2021.06.30 දිනට පෙර මැනුම් ඉල්ලීම යොමු කළ යුතු වේ. මැනුම් කටයුතු සිදුකරන තෙක් ඉඩම් භාර දීම ප්‍රමාද නොකළ යුතුය. GPS ඛණ්ඩාංක භාවිතා කර ඉක්මනින් අනුරේඛනයක් මගින් ඉඩම් කොටස් භාර දීමට කටයුතු කළ යුතු වේ.

**1.2. ඉඩමට ප්‍රවිෂ්ට වීම සඳහා අවසර ලබා දීම.**

මැනුම් කටයුතු සිදුකර රජයේ ඉඩම සඳහා විධිමත් ලේඛනයක් නිකුත් කරන තෙක් රජයේ ඉඩමට ප්‍රවිෂ්ට වී සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට ව්‍යවසායකයන්ට හැකියාව ලැබෙන පරිදි, ඉඩමට ප්‍රවිෂ්ට වීමේ අවසරයක් ලබා දිය යුතු වේ. ඒ සඳහා මෙහි ඇමුණුම 01 මගින්



Scanned with CamScanner

හඳුන්වා දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය භාවිතා කළ යුතුවේ. එම කාලය තුළ බලලත් රජයේ නිලධාරියෙකුට ඕනෑම අවස්ථාවක ඉඩමට ඇතුලුවී, සංවර්ධන කටයුතු වල ප්‍රගතිය පරීක්ෂා කල හැකි අතර, ප්‍රමාණවත් සංවර්ධනයක් සිදු නොකරන්නේ නම් හා අනුමත ව්‍යාපෘතියට පරිබාහිර කාර්යයක් සඳහා ඉඩම යොදාගෙන තිබේනම් තෝරා ගැනීම අවලංගු කිරීමට කටයුතු කළ යුතුවේ. එවැනි අවස්ථාවක දී ඒ පිළිබඳව මට ද පිටපතක් සහිතව ඉඩම් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා එවිය යුතු වේ.

මෙම ඉඩමට ප්‍රවිශ්ට වීම සඳහා ලබා දෙන අවසරය වසරක කාලයක් සඳහා පමණක් වලංගු වන අතර එම කාලය තුළ සිදු කරන ලද සංවර්ධන තත්වය හා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉටුකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳ සලකා බලා, ඉඩම සඳහා අයෝජකයන් වෙත දීර්ඝ කාලීන බදු ලබා දීමේ කටයුතු ආරම්භ කළ යුතු වේ.ව්‍යවසායකයාගේ පාලනයෙන් තොරවූ යම් හේතුවක් මත, අපේක්ෂිත පරිදි ඉඩම සංවර්ධනය කිරීමට ව්‍යවසායකයා අපොහොසත් වන්නේ නම්, ඉඩමට ප්‍රවිශ්ට වීමේ අවසරය තවත් වසරක් සඳහා දීර්ඝ කර ලබා දීමට හැකියාව ඇත.

හඳුනාගත් ඉඩම සඳහා මැනුම් ඉල්ලීම යැවීම හා තරුණ ව්‍යවසායකයා වෙත ඉඩමට ප්‍රවිශ්ට වීමේ අවසරය ලබා දීම සමගාමීව සිදු විය යුතුවේ.

ඒ අනුව තෝරාගත් තරුණ ව්‍යවසායකයන් වෙත සුදුසු ඉඩම් ලබා දීම ජනාධිපති කාර්යාලයෙන් නියම කරන දිනයන්හිදී සිදුකර අවසන් කළ යුතු බැවින් ඒ සඳහා පූර්ව සූදානමකින් කටයුතු කරන ලෙස දන්වා සිටිමි. තරුණ ව්‍යවසායකයන් සඳහා ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් වූ ප්‍රගතිය මෙහි ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව මා වෙත වාර්තා කළ යුතුවේ.

**1.3.පසු විපරම් කටයුතු සිදු කිරීම.**
ඉඩමට ප්‍රවිශ්ට වීමේ අවසරය ලබා දීමෙන් අනතුරුව අවම වශයෙන් සෑම මසකට වරක් ඉඩමට ඇතුලු වී පරීක්ෂා කළ යුතු වේ. ඒ සඳහා ඔබගේ සුදුසු නිලධාරියෙකු පත් කළ යුතු අතර, මෙහි ඇමුණුම - 03 ආකෘතිය අනුව පසු විපරම් කාඩ් පතක් හඳුන්වා දී නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතු වේ.

**02. තෝරාගත් තරුණ ව්‍යවසායකයා වෙත ලබාදීම සඳහා සුදුසු රජයේ ඉඩමක් හඳුනාගෙන නොමැති අවස්ථාවලදී කටයුතු කළ යුතු ආකාරය.**

තෝරාගත් සෑම තරුණ ව්‍යවසායකයෙකු වෙතම සුදුසු අවම ඉඩම් කොටසක් හෝ ලබාදිය යුතු බැවින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘතිය සඳහා ලබාදිය යුතු අවම බිම් ප්‍රමාණය ලබාදීමත් , ප්‍රදේශයේ පවතින හිස් සහ ඌන උපයෝජිත ඉඩම් ඵලදායී ලෙස යොදවා ගැනීමත් අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ STM/03/PRO.1 හා 2021.03.04 දිනැති "තරුණ ව්‍යවසායකත්වය දිරිගැන්වීම සඳහා රජයේ ඉඩම් වල ආයෝජන අවස්ථා ලබාදීමේ වැඩසටහන" නමින් වූ උපදෙස් ලිපියේ ඇමුණුම 01 මගින් දක්වා ඇති උපදෙස් පරිදි කඩිනමින් කටයුතු කර එක් එක් ව්‍යවසායකයා සඳහා ලබාදිය හැකි සුදුසු ඉඩම් කොටසක් ලබා දීමට පහත පරිදි කටයුතු කලයුතු වේ.

**2.1.** ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පවතින රජයේ ඉඩම් වලින් මෙම වැඩසටහන සඳහා යොදාගත හැකි සුදුසු ඉඩම් කොටසක් හඳුනා ගැනීමට ප්‍රථමයෙන්ම කටයුතු කලයුතු වේ. මෙහිදී තරුණ ව්‍යවසායකයින් සඳහා ඉඩම් ලබාදීම පිණිස ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සුදුසු ඉඩම් හඳුනාගෙන ඇති අතර එසේ හඳුනා ගන්නා ලද ඉඩම්, තෝරාගත් තරුණ ව්‍යවසායකයින් වෙත බෙදාදීම කෙරෙහි අවධානය යොමු කළ හැකිය.



Scanned with CamScanner

**2.2.** මාගේ 2020/18 චක්‍රලේඛය මඟින් උපදෙස් ලබා දී ඇති පරිදි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරනු ලබන කැලෑ නොවන ඉඩම් ද ව්‍යාපෘතිය සඳහා යොදවා ගැනීමේ හැකියාවක් පවතිනම් ඒ සඳහා ක්‍රියා කළ යුතු වේ. එවැනි ඉඩමක් මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් තරුණ ව්‍යවසායකයින් වෙත ලබා දීම යෝග්‍ය බව පෙනී යන්නේ නම් , ඒ පිළිබඳව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ට පිටපතක් සහිතව මා වෙත දන්වා එවිය යුතුවේ.

**2.3.** ලබාදිය හැකි වෙනත් රජයේ ඉඩමක් නොමැති නම් රජයේ ආයතන වෙත වෙන්කර ඇති ඌන උපයෝජිත ඉඩම් මෙම ව්‍යාපෘතිය සඳහා යෙදවීම කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය. එසේම එක් රාජ්‍ය ආයතනය සතු ඉඩමෙන් ලබාගත යුතු අවම බිම් ප්‍රමාණය ඔබ විසින් තීරණය කලයුතු අතර එම ඉඩම් කොටස ඔබ වෙත පවරා ගැනීම සඳහා වන ඉල්ලීම මා වෙත යොමු කරන්න.

**03.තෝරාගත් තරුණ ව්‍යවසායකයින් දැනටමත් රජයේ ඉඩමක් භුක්ති විඳින්නේ නම් කටයුතු කළ යුතු ආකාරය.**

තෝරාගත් තරුණ ව්‍යවසායකයා විසින් භුක්ති විඳින රජයේ ඉඩම සඳහා විධිමත් තෝරාගැනීමක් යටතේ නීත්‍යානුකුල ලියවිල්ලක් ලබා දී නොමැති නම් , එම පුද්ගලයා විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතිය සඳහා එම ඉඩම යොදාගැනීමට හැකි වන පරිදි මෙහි 01 කොටසේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ.

තෝරාගත් තරුණ ව්‍යවසායකයා භුක්ති විඳින ඉඩම සඳහා විධිමත් ලේඛණයක් ලබාදී තිබේ නම්, මෙහි 01 කොටසේ සඳහන් පරිදි ඉඩමට ප්‍රවිශ්ට වීමට අවසර පත්‍රයක් ලබාදීම අවශ්‍ය නොවේ.අනුමත ව්‍යාපෘතිය සඳහා ඉඩම යොදා ගැනීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම ව්‍යවසායකයා වෙත ලබාදිය යුතු අතර 1.3 හි පරිදි නිරන්තර පසු විපරම් කටයුතු කළ යුතුවේ. ව්‍යාපෘතිය ආරම්භ කර වසරක කාලයක් ගත වීමෙන් අනතුරුව ව්‍යාපෘතියේ ස්වභාවය, ශක්‍යතාවය හා ප්‍රගතිය සලකා බලා දීර්ඝකාලීන බදු බලපත්‍රයක් ලබා දීම සලකා බැලිය යුතු වේ.

මෙහි ඇමුණුම 02 හි පරිදි ප්‍රගතිය වාර්තා කිරීමේ දී ව්‍යවසායකයා සතුව පවතින ඉඩමේ අයිතිය සනාථ කිරීමේ ලේඛණයේ ස්වභාවය පිළිබඳව වෙනත් කරුණු යටතේ සඳහන් කර එවීමට කටයුතු කල යුතු වේ.

**04.** මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ යම් ගැටලුවක් වේ නම් මා විමසන්න.

ජී.ඩී.කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:

1.ලේකම්,ඉඩම් අමාත්‍යාංශය -කා.දැ.ගැ.පි

2.අධ්‍යක්ෂ ජනරාල්,ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
3.සර්වේයර් ජනරාල්
4.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
5.සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
6.අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස්වරුන්
} -කාරු.දැ.ගැ.ස. හා අ.ක.ස.



Scanned with CamScanner

## ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ අංක 2021/03 යටතේ රජයේ ඉඩමට ප්‍රවිෂ්ය වීමේඅවසරය ලබාදීම

.............................. දිස්ත්‍රික්කයේ .......................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් ........................................................................................ වන මම, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2021/03 දරණ චක්‍රලේඛයේ උපදෙස්/ කොන්දේසිවලට යටත්ව ................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ........................... ග්‍රාම නිලධාරී වසමේ ............................ ගමේ ............................ නමැති ඉඩමෙන් පහත මායිම් තුළ පිහිටි හෙක්ටයාර් ......... අක්කර ...................... රූඩ් ............................ පර්චස් ........................ වූ ඉඩමේ,..................................ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පළමු උපලේඛනයේ සඳහන් රජයේ ඉඩමට ප්‍රවිෂ්ය වීමේ අවසරය මෙහි දෙවන උපලේඛනයේ කොන්දේසිවලට යටත්ව, ........................................................................................ ලිපිනයේ පදිංචි ........................................................................ යන අයට ............................ දින සිට ........................................ දින දක්වා ලබා දෙමි.

### පළමු උපලේඛනය

**මායිම් :**

උතුරට : ........................................................................

දකුණට : ........................................................................

නැගෙනහිරට : ........................................................................

බස්නාහිරට : ........................................................................

### දෙවන උපලේඛනය

**කොන්දේසි :**

01. ඉඩම සංවර්ධනය කිරීම සඳහා රජයේ ඉඩමට ප්‍රවිෂ්ය වීමේ අවසරය හිමි වේ.

02. මෙම අයිතිය කිසිසේත්ම ඉඩමේ හිමිකම පිළිබඳ අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමට ලැබෙන හිමිකමක් සේ නොසැලකිය යුතුය.

03. මෙම රජයේ ඉඩමට ප්‍රවිෂ්ය වීමේ අවසරය අන්සතු කිරීම සපුරා තහනම් වේ.

04. මෙම අවසරය අදාල ව්‍යවසායකයාට පෞද්ගලික වූවක් සේ සැලකිය යුතු වේ.

05. මෙම අවසරය නිකුත් කළ දින සිට වසරකට පමණක් වලංගු වන අතර වාර්ෂිකව දීර්ඝ කිරීමට හෝ අවලංගු කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත.

06. තරුණ ව්‍යවසාය දිරිගැන්වීමේ වැඩසටහන යටතේ අනුමැතිය හිමි වූ ...................... ව්‍යාපෘතිය සඳහා පමණක් මෙම ඉඩම යොදා ගත යුතුය.

07. ව්‍යාපෘතියට අවශ්‍ය පරිදි ඉඩම සංවර්ධනය කිරීමට ව්‍යවසායකයාට හිමිකම ඇත. එසේවුවද, භූමිය මතුපිට හෝ අභ්‍යන්තරයේ ඇති කිසියම් වූ ඛණිජ ද්‍රව්‍යයක් කැණීම, හෑරීම, කැඩීම, එක්රැස් කිරීම හෝ ඉවත් කිරීම සපුරා තහනම් වේ. එවැනි යමක් නිරීක්ෂණය වුවහොත් ඒ පිළිබඳ වහාම ප්‍රාදේශීය ලේකම් දැනුවත් කළ යුතු වේ.

08. නිකුත් කළ දින සිට මසක් ඇතුලත සංවර්ධන කටයුතු ආරම්භ කළ යුතුය.

Scanned with CamScanner

09. කොන්දේසි කඩකරන අවස්ථාවලදී රජයේ ඉඩමට ප්‍රවිෂ්ට වීමේ අවසරය ඒකපාර්ශවීයව අවලංගු කිරීමට ප්‍රාදේශීය ලේකම්ට බලය ඇත.

10. අදාළ රාජ්‍ය නිලධාරියෙකුට මෙම ඉඩමට ඇතුළුවීමට,සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීමට හා උපදෙස් ලබාදීමට බලය ඇත.

11. ප්‍රාදේශීය ලේකම්ගේ හා අදාල අනෙකුත් ආයතනවල කොන්දේසි හා උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

12.

13. මෙම අවසරය හිමිවන කාලය තුළ සිදු කරන ලද සංවර්ධන තත්වය හා ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉටුකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳ සලකා බලා, ඉඩම සඳහා දීර්ඝ කාලීන බදු ලබා දීමටකටයුතු කරනු ලැබේ.

..................................

දිනය

..................................................

ප්‍රාදේශීය ලේකම්/ (අන්තර් පළාත්) ඉඩම් කොමසාරිස්/
සහකාර ඉඩම් කොමසාරිස්ගේ අත්සන හා නිල මුද්‍රාව

මෙහි සඳහන් කොන්දේසි හොඳින් කියවා බලා තේරුම්ගත් බවත්, එම කොන්දේසි වලට මා එකඟ වන බවත්ප්‍රකාශ කරමි.

..................................

දිනය

..................................................

අවසරපත්‍රකරුගේ අත්සන

නම : ............................................

ලිපිනය : ......................................

..........................................

සාක්ෂි :

01. ....................................................................

02. ....................................................................

Scanned with CamScanner

# තරුණ ව්‍යවසායකයින් 100,000ක් සඳහා ආයෝජන අවස්ථා ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රගතිය ලබා ගැනීම.

දිස්ත්‍රික්කය : ------------------------------------

ප්‍රා.ලේ.කොට්ඨාශය :-------------------------

| අනු අංකය | තෝරාගත් තරුණ ව්‍යවසායකයාගේ නම | ලිපිනය | ජා.හැ.ප. අංකය | අනුමත ව්‍යාපෘතිය | අනුමත ඉඩම් ප්‍රමාණය | ග්‍රා.නි.වසම | ඉඩමට ප්‍රවිශ්ය වීමට අවසරය ලබා දුන් දිනය | වෙනත් විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

Scanned with CamScanner

## පසු විපරම් පත්‍රිකාව.

තරුණ ව්‍යවසායකයාගේ නම : ______________________

ලිපිනය: ______________________

ව්‍යාපෘතිය: ______________________

ග්‍රා.නි.වසම: ______________________

ඉඩමට ප්‍රවිශ්ඨ වීමට අවසරය ලබා දුන් දිනය : ______________________

පසු විපරම් කළ යුතු නිළධාරියාගේ නම: ______________________

තනතුර: ______________

| පසු විපරම් වාර්තාව | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | වේලාව | නිරීක්ෂණ | නිළධාරියාගේ අත්සන | අධීක්ෂණ නිළධාරියාගේ සටහන් | අධීක්ෂණ නිළධාරියාගේ අත්සන |
| | | | | | |

Scanned with CamScanner